# වාර්ෂික වාර්තාව
# 2017

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**සභාපතිතුමාගේ පණිවුඩය**



පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය සංක්ෂිප්තව දැක්වෙන 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ හද පිරි සතුටිනි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ස්ථාපනය කර වසර 14 කට පසුව එහි කාර්යසාධනය සමාලෝචනය කිරීමේ දී අධිකාරිය විසින් තරඟකාරී ව්‍යාපාරික පරිසරයක් තුළ පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා වන ව්‍යවස්ථාපිත අරමුණු සැලකියයුතු අන්දමින් ළඟාකරගෙන ඇති බව අනිවාර්යයෙන් සඳහන් කළ යුතු කරුණකි.

තාක්ෂණික වශයෙන් දියුණු වත්මන් යුගයෙහි විවෘත ආර්ථික ව්‍යාපාරික පරිසරය තුළ ඕනෑම උගත් පාරිභෝගිකයෙකු අසාධාරණ ව්‍යාපාරික ප්‍රතිපත්ති, කොන්දේසිගත ව්‍යාපාර, සීමාකාරී වෙළඳාම් සහ අසාධාරණ ව්‍යාපාරික කොන්දේසි ආදී පාරිභෝගික යහපැවැත්මට අහිතකර අන්දමින් බලපාන අවිධිමත් වෙළඳ ප්‍රතිපත්තීන්ට මුහුණ දියහැකිය. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙම අර්බුදකාරී පරිසරය තුළ පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නෛතික අවසරය ලැබී ඇති පරිදි විශේෂ නියමයන් නිකුත් කිරීම මඟින් මහත් පරිශ්‍රමයක් දරා තිබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා රේගුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය සමඟ සහයෝගීත්වයෙන් පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා පාරිභෝගික හිතකාමී ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබේ. මීට අමතරව වෙළඳ සහ පාරිභෝගික යන දෙපාර්ශවයම දැනුවත් කිරීමේ අරමුණින් වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට අධිකාරිය කටයුතු කර ඇති අතර එමඟින් ශ්‍රී ලාංකික ව්‍යාපාරික පරිසරය තුළ සවිඥානික පාරිභෝගික මෙන් ම ව්‍යාපාරික ප්‍රජාවක් බිහිවීම සහතික කර තිබේ.

අධිකාරිය විසින් සාමාන්‍ය ජනතාව සහ වෙළඳ ප්‍රජාව දැනුවත්කිරීම සඳහා 2017 වර්ෂයේ දී මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 255ක් සහ වෙළෙඳ ප්‍රජාව දැනුවත්කිරීමේ වැඩසටහන් 214 ක් පවත්වා තිබේ. මීට අමතරව පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳව ළමා පරපුර දැනුවත්කිරීමේ අරමුණින් පාසල් දැනුවත්කිරීමේ වැඩසටහන් 105 ක් පවත්වන ලදී. තවද, සාර්ථක වැටලීම් 25,605 සිදුකර වංචාකාරී වෙළෙන්දන්ට විරුද්ධව අධිකරණයේ නඩු 25,071 ක් පවරන ලදී. මෙම නඩු මඟින් අයකර ගන්නා ලද දඩ මුදල රුපියල් මිලියන 98 ට අධිකය. එම දඩ මුදල 2016 වර්ෂයට සාපේක්ෂව 7.7% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි අභියෝගාත්මක බලය මඟින් පාරිභෝගික පැමිණිලි කෙරෙහි මැදිහත් වීමට අධිකාරියට බලය ලබාදෙන අතර 2017 වර්ෂයේ දී පැමිණිලි 2301 ක් ලද අතර ඒ සම්බන්ධයෙන් විමර්ශන පවත්වා නියෝග නිකුත් කරන ලදී. නිකුත් කරන ලද නියෝග කෙරෙහි එකඟතාවය පළ නොකරන ලද පාර්ශවයන් සම්බන්ධයෙන් මූලික නෛතික ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන තිබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි සාර්ථකත්වය කරා යාමට සහයෝගය දැක්වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට මෙන්ම කාර්ය මණ්ඩල සාමාජිකයන්ට මාගේ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

තවද අගනා උපදෙස්, අභිප්‍රේරණය සහ මඟපෙන්වීම ලබාදුන් ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් (පා.ම.) මැතිතුමාට සහ කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයේ ලේකම්තුමාට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

අවසන් වශයෙන් අධිකාරිය විසින් සපයන ලද සේවාවන් ඇගයීමට ලක්කරමින් ප්‍රශංසා යොමු කරන ලද සියලුම පාරිභෝගිකයන් / පැමිණිලිකරුවන් වෙත මාගේ ස්තුතිය පළ කරනු කැමැත්තෙමි.

ආචාර්ය ලලිත් එන් සෙනවීර

සභාපති

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**දැක්ම**

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම

**මෙහෙවර**

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

**ඒකාබද්ධ ඉලක්ක**

1) වෙළෙඳාම විධිමත් කිරීම තුළින් වඩාත් තෘප්තිමත් වූ පාරිභෝගිකයින් බිහි කිරීම.
2) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලදී පාරිභෝගිකයාට සහන සැලසීම.
3) අධ්‍යාපනය සහ දැනුවත් කිරීම තුළින් පාරිභෝගිකයින් සවිබල ගැන්වීම.
4) තරඟ විරෝධී චර්යාවන්ට එරෙහිව වෙළෙන්දන් හා සාදන්නන් ආරක්ෂා කරමින් යහපත් තරඟකාරිත්ව ප්‍රවර්ධනය කිරීම.
5) අධිකාරියෙහි කටයුතු පුළුල් කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම.

**ආයතනික සාරධර්ම**

- විශ්වාසනීයත්වය

  කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම.

- අවංකභාවය සහ ඍජුභාවය

  සියලුම කාර්යයන්හි දී අවංකවීම, සාධාරණ වීම සහ යුක්තිගරුකවීම.

- වගකීමට බැඳී සිටීම

  විනිවිදභාවය ආරක්ෂා කිරීම, වගකිවයුතුබව සහ ඉටුකරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම.

- කණ්ඩායම් හැඟීම ගරු කිරීම

  අන්‍යොන්‍ය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩනැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලීභාවය වර්ධනය කරමින් පොදු ඉලක්කයන් කරා ළඟාකරගැනීම උදෙසා සියලුම සේවකයින් එක්ව කටයුතු කිරීම.

- ප්‍රසාදය පළ කිරීම

  සේවකයින්ගේ විශිෂ්ට කාර්යඵල අගය කිරීම සහ ප්‍රශංසා කිරීම

- අරමුණු ළඟා කරගැනීම සඳහා කැපවීම

  පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටුකිරීම

- විශ්වසනීය ප්‍රතිචාර දැක්වීම

  සේවා සැලසීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම

- නිර්මාණශීලිත්වය සහ නව ක්‍රමෝපායන් භාවිතයට ගැනීම
  සියලුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ නව අදහස් උත්පාදනය කිරීම

1 වන සහ 2 වන මහළ

සතොස මහලේකම් ගොඩනැගිල්ල

අංක. 27, වොක්ෂෝල් වීදිය

කොළඹ 02

2019.03.07

ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවතපදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා,

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2017 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් වාර්තාව සහ විගණකාධිපති වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,

ආචාර්ය ලලිත් එන් සෙනවීර

සභාපති

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

වාර්ෂික වාර්තාව -2017


| පටුන | පිටු අංකය |
|---|---|
| 1. අප ගැන | |
| 1.1 හැඳින්වීම - - - - - - - | 6 |
| 1.2 අධිකාරිය පිහිටුවීම - - - - - | 6 |
| 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය - - - - - - | 6 |
| 1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව - - - - | 7 |
| 2. අධිකාරියේ අරමුණු - - - - - | 8 |
| 3. අධිකාරියේ කාර්යභාරය - - - - - - | 8-9 |
| 4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය / පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව -2017- - - - - - | 10-27 |
| 5. 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය - - | 28 |
| 6. 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය - - - - - - | 29 |
| 7. 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය 2017 - - - - - | 30-37 |
| 8. 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව - - - - - - | 38-46 |

9. විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ අදහස් - - 47-50

## 1.1 හැඳින්වීම

1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත අවලංගු කරමින් සම්මත කරන ලද 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතේ පූර්විකාව අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළඳාම සහ භාණ්ඩ හා සේවා මිල ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම, අසාධාරණ සහ සීමිත වෙළ පිළිවෙත්වලට එරෙහිව වෙළෙඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමයි. තවද හැකි සෑම අවස්ථාවකදී ම තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම, භාණ්ඩ හා සේවා වෙළෙඳුන් සහ නිෂ්පාදකයන් අතර යහපත් තරඟයක් පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ.

## 1.2 අධිකාරිය පිහිටුවීම

පනෙතහි විධිවිධාන අනුව අධිකාරිය සභාපතිවරයෙකුගෙන් සහ පනතෙහි විශේෂයෙන් දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයින් අතරින් අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන දහයකයට නොඅඩු සංඛ්‍යාවක් වන සාමාජිකයින්ගෙන් ද සමන්විත වේ.

**අධිකාරියේ සාමාජිකයින්**

2017 වර්ෂය අවසානය වන විට තනතුරු දරන ලද සාමාජිකයින් ගේ නම් පහත පරිදි වේ:

1. හසිත තිලකරත්න මහතා — සභාපති
2. ආචාර්ය එම්. එම්. හිල්මි — පූර්ණ කාලීන සාමාජික
3. එම්.ඉසෙඩ්. රසීන් මහතා — පූර්ණ කාලීන සාමාජික
4. ඒ.ආර්.බී. නිමත්දීන් මහතා — පූර්ණ කාලීන සාමාජික
5. ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මෙය — භාණ්ඩාගාර නියෝජිත
6. එස්.ටී. අබේගුණවර්ධන මහතා — සාමාජික – 2017.09.08 දින ඉල්ලා අස් විය.
7. එම්.ටී.ඒ. සෙයින් මහතා — සාමාජික
8. රූබන් වික්‍රමාරච්චි මහතා — සාමාජික
9. එච්.බී. දයාරත්න මහතා — සාමාජික
10. වරුණ සුරේන් අලව්ව මහතා — සාමාජික
11. ආචාර්ය ඒ.එම්.එම්.රියාස් — සාමාජික
12. සින්නතම්බි නාගයියා මහතා — සාමාජික
13. අබ්දුල්ලා නසීර් මහතා — සාමාජික
14. ඒ.ඒච්.ඒම්.යූ. අරුණ බණ්ඩාර මහතා නිරීක්ෂක, රේඛීය අමාත්‍යාංශ නියෝජිත

## 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය

හසිත තිලකරත්න මහතා 2017 වර්ෂයේ දී අඛණ්ඩව සභාපති ධූරය දැරීය. ඩී. ජීවනාදන් මහතා (ශ්‍රී ල.ප.සේ) 2017.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත්විය.

**අධිකාරියේ අංශ ප්‍රධානීන්**

| | |
|---|---|
| 1. දීප්ති තිසේරා මිය<br>M.PA [PIM-Sri J] – නීතිඥ<br>අධ්‍යක්ෂිකා - නීති සහ බලගැන්වීම් | 2. චන්ද්‍රිකා තිලකරත්න මිය<br>B.Sc Agri (Sp) M.Sc (Mgmt)<br>අධ්‍යක්ෂිකා - පාරිභෝගික කටයුතු සහ තොරතුරු |
| 3. ශාන්තිනී තිරුනීලකන්දන් මිය<br>[ACEA]<br>අධ්‍යක්ෂිකා - තරඟකාරීත්ව ප්‍රවර්ධන<br>2017.11.06 දින විශ්‍රාම ගැන්විය. | 4. සම්පත් අඟුලුගහ මහතා<br>B. Com (Sp) Hons, AIPM(SL). Dip in PM<br>අධ්‍යක්ෂ-මානව සම්පත් සහ පරිපාලන |
| 5. ඩබ්ලිව්.එම් . ප්‍රියන්ත මහතා<br>MPM, B.Com (Sp) Hons, AIPFM, DPFM අධ්‍යක්ෂ - මූල්‍ය | 6. නිරංජලා ජෙගනාදන් මෙය<br>ACA, MBA (J'pura)<br>අධ්‍යක්ෂිකා - මිලකිරීම් සහ කළමනාකරණ |
| 7. රසිකා සාවිත්‍රි විජේසේකර මිය<br>B.Sc Accounting (Sp) Hon USJ, CBA,MAAT<br>අභ්‍යන්තර විගණක | |

## 1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

වාණිජ නීතිය, ව්‍යාපාරික , ව්‍යවසාය කළමනාකරණය, වෙළඳ ප්‍රතිපත්ති සහ පාරිභෝගික කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් සහිත විශේෂඥවරුන් තිදෙනෙකුගෙන් සමන්විතව මෙම සභාව පිහිටුවන ලදී . මෙම සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් යොමුකරනු ලබන සියලු ඉල්ලීම් කෙරෙහි යොමු වී තීරණ ගතයුතුය. තවද, පනතෙහි 38 වන වගන්තිය යටතේ තරඟ විරෝධී චර්යාවන් සම්බන්ධ පැමිණිලි සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම සහ තීරණ ගැනීම, 19 වන වගන්තිය යටතේ උපරිම සිල්ලර මිල නියම කිරීම, සහ 19 වන සහ 20 වන වගන්ති යටතේ අනිසි මිලගණන් සම්බන්ධයෙන් චෝදනා කිරීම පිළිබඳ වගකීමට සභාව බැඳී සිටියි.

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයින්</u>

| | | |
|---|---|---|
| එන්. එම්. ෂහීඩ් මහතා | - | සභාපති |
| ඩී.ඩබ්ලිව් ජොන්දාසන් | - | සාමාජික |
| එම්.ඩී.එම්.රිස්වි මහතා | - | සාමාජික |
| ලේඛා ආර්යරත්න මෙය (නීතිඥ) | - | සභා ලේකම් |

**2. අධිකාරියේ අරමුණු**

අ. පාරිභෝගිකයින්ගේ ජීවිත සහ දේපළවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.

ආ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.

ඇ. හැකි සෑමවිටම පාරිභෝගිකයින්ට තරඟකාරී මිලකට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම.

ඈ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහන ලබාදීම.

**3. අධිකාරියේ කාර්යභාරය**

1) අධිකාරිය විසින් පහත දෑ පාලනය කිරීම හෝ ඉවත් කිරීම සිදු කරනු ලැබේ –

   අ. ව්‍යවසාය අතර සීමාකාරී වෙළෙඳ ගිවිසුම්

   ආ. ව්‍යවසායයන් අතර මිළ පිළිබඳ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මකකිරීම

   ඇ. වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළඳපොළේ සැලකියයුතු කොටසක දේශීය වෙළඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදාගැනීම; හෝ

   ඈ. දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරීත්වය

2) තරඟ විරෝධී හා ආධිපත්‍ය තත්ත්වයන් අනිසි ලෙස යොදාගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ සිදුකිරීම.

3) භාණ්ඩ හෝ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරීත්වය පවත්වාගෙන ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.

4) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගතහැකිවීම සහ ඒවායේ තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, මිලදීගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම

5) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම.

6) මෙම පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම.

7) වෙළෙඳපොල තරඟකාරීත්වය අඩු ඵලදායීතාවෙන් පවතින අවස්ථාවලදී වෙළෙඳපොළෙහි තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම

8) වෙළෙඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට අදාලව අධ්‍යයන භාරගැනීම, වාර්තා පළකිරීම, සහ මහජනතාවට තොරතුරු සැපයීම.

9) රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාරගැනීම.

10) පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම.

11) වෙළෙඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම.

12) පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම

13) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම.

14) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය වියහැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත්කිරීම; සහ

15) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කටයුතු ඉටුකිරීම.

## 4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය

ආයතනික ව්‍යුහය අනුව අධිකාරිය අධ්‍යක්ෂවරුන් 6 දෙනෙක් යටතේ පාලනය වන අංශ 6 කින් සහ අභ්‍යන්තර විගණන අංශයකින් සමන්විත වේ.

එනම්;

1) පාරිභෝගික කටයුතු සහ තොරතුරු අංශය
2) නීති සහ බලගැන්වීම් අංශය
3) මිලකිරීම් සහ කළමනාකරණය අංශය
4) තරඟකාරීත්ව ප්‍රවර්ධන අංශය
5) මුදල් අංශය
6) මානව සම්පත් සහ පරිපාලන අංශය
7) අභ්‍යන්තර විගණන අංශය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2017 වර්ෂය සඳහා වන කාර්යසාධනය පහත දැක්වේ;

**1. හානිකර මෙන්ම ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සහ සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කරගැනීම**

අ. පනතෙහි 10 වන සහ 12 වන වගන්ති යටතේ නිකුත් කරන ලද විධාන

- **විධාන අංක 63 –** ක්‍රියාත්මක වෝල්ටීයතාව 250 ට නොවැඩි ලැයිස්තුවෙහි දක්වා ඇති අයිතම / නිෂ්පාදන, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් නිකුත් කරනු ලබන ප්‍රමිති සහතික ලාංඡනය දරන්නේ නම් මිස නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, බෙදාහැරීම, ගබඩා කිරීම හෝ තොග වශයෙන් හෝ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු බවට සියලු නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන් සහ වෙළෙන්දන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් විධාන කරනු ලැබේ. (පේනු (Plugs), පේනු වලට සවි කරන ලද විදුලි රැහැන් (Cables reels fitted with plugs) සහ කෙවෙනි පිටමුව ( socket outlets)

- **විධාන අංක 64 –** ක්‍රියාත්මක වෝල්ටීයතාව වෝල්ට් 250 ට නොවැඩි කිසියම් විදුලි උපකරණයක් විදුලි පේනුවක් දරන්නේ නම් මිස නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, බෙදාහැරීම, ගබඩා කිරීම හෝ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු බවට සියලු නිෂ්පාදකයන් ආනයනකරුවන් සහ වෙළෙන්දන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් විධාන කරනු ලැබේ.

ආ. 20(5) වගන්තිය යටතේ නියෝග

- **නියෝග අංක.** 40 – මයිසූර් පරිප්පු, වියළි හාල්මැස්සන්, මුං ඇට, සුදු සීනි, අර්තාපල් සඳහා උපරිම සිල්ලර මිල
- **නියෝග අංක.**41 – සහල් සඳහා උපරිම සිල්ලර මිල
- **නියෝග අංක.**42 – දේශීය නිෂ්පාදිත සහ ආනයනිත සහල් සඳහා උපරිම සිල්ලර මිල
- **නියෝග අංක.** 43 – සුදු සීනි සහ අධි ශීතකළ හෝ ශීතකළ කුකුළු මස් (සම්පූර්ණ කුකුළා) සඳහා උපරිම සිල්ලර මිල නියම කරන ලද නියෝග අංක 39 සහ 40 අහෝසි කිරීම.
- **නියෝග අංක.**44 – නිෂ්පාදිත සහ ආනයනිත සහල් සඳහා උපරිම සිල්ලර මිල
- **නියෝග අංක.** 45 – සහල් සඳහා උපරිම සිල්ලර මිල නියම කරන ලද නියෝග අංක 44 අවලංගු කිරීම.
- **නියෝග අංක.** 46 – වියළි හාල්මැස්සන් සඳහා උපරිම සිල්ලර මිල නියම කරන ලද නියෝග අංක 40 අහෝසි කිරීම.
- **නියෝග අංක.**47 –නියෝග අංක 39 හි සඳහන් ග්‍රෑම් 400 සස්ටජන් යන අයිතමය ඉවත් කිරීම.
- **නියෝග අංක** 48 **-** මයිසූර් පරිප්පු, කට්ටා, සාලයා, පොල් සඳහා උපරිම සිල්ලර මිල
- **නියෝග අංක** 49 – ආනයනිත සහ දේශීය නිෂ්පාදිත නාඩු සහල් සඳහා උපරිම සිල්ලර මිල

ඇ. **ගුණාත්මකභාවයෙන් අඩු ආනයනික භාණ්ඩ විමර්ශනය කිරීම**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණයෙන් ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ දිවයිනට ඇතුළුවීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ. එබඳු සිද්ධීන් 67 ක් විමර්ශනය කරන ලද අතර ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ ප්‍රමිතීන්ට අනුකූල නොවීම හේතුවෙන් ප්‍රති- අපනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශ කරන ලදී.

**ඇ.ජාතික කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති / නීති හඳුන්වාදීම**

ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සෞඛ්‍ය අමාත්‍යාංශය , තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය , පරිසර අමාත්‍යාංශය , බලශක්ති අමාත්‍යාංශය , ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික කවුන්සිලය යටතේ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සහ නීති හඳුන්වා සහාය දක්වයි.

**2. වංචාකාරී කටයුතු සහ අසාධාරණ වෙළඳ පිළිවෙත් වලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම**

අ. ව්‍යාපාරික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ සිවිල් සමාජ සහභාගීත්ව වැඩසටහන් මඟින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂාකිරීම, සංවර්ධනය කිරීම සහ බලය ලබාදීම සිදුකරනු ලැබේ.

2017 වර්ෂයේදී අධිකාරිය විසින් ව්‍යාපාරික ප්‍රජාව සඳහා වැඩසටහන් 214 ක් ක්‍රියාත්මක කරන ලදී.

**වගු අංක 1** - 2017 දී පවත්වන ලද ව්‍යාපාරික දැනුවත් කිරීමේ වැඩසටහන්

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ව්‍යාපාරික දැනුවත් කිරීමේ වැඩසටහන්** |
|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 10 |
| | මාතලේ | 13 |
| | නුවරඑළිය | 08 |
| නැගෙනහිර පළාත | අම්පාර | 18 |
| | මඩකලපුව | 02 |
| | ත්‍රිකුණාමලය | 14 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 04 |
| | පොළොන්නරුව | 10 |
| උතුරු පළාත | යාපනය | 01 |
| | කිලිනොච්චි | 07 |
| | මන්නාරම | 15 |
| | මුලතිවු | 29 |
| | වව්නියාව | 12 |
| වයඹ පළාත | කුරුණෑගල | 02 |
| | පුත්තලම | 06 |
| සබරගමු පළාත | කෑගල්ල | - |
| | රත්නපුර | 03 |
| දකුණු පළාත | ගාල්ල | 07 |
| | හම්බන්තොට | 09 |
| | මාතර | 05 |
| ඌව පළාත | බදුල්ල | 04 |
| | මොණරාගල | 02 |
| බස්නාහිර පළාත | කොළඹ | 26 |
| | ගම්පහ | 03 |
| | කළුතර | 04 |

| එකතුව | 214 |
|---|---|

ආ. වෙළෙඳපොළෙහි සිදුකරන ලද වැටලීම් සහ විමර්ශන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතෙහි විධිවිධාන අනුව ලේබලයෙහි උපදෙස් ප්‍රදර්ශනය කිරීම උල්ලංඝණය කිරීම , භාණ්ඩයේ සඳහන් මිලට වඩා වැඩි මිලකට අලෙවි කිරීම, භාණ්ඩ අලෙවි කිරීම ප්‍රතික්ෂේප කිරීම , භාණ්ඩ සන්තකයෙහි තබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සඟවා තබාගැනීම , අධිකාරියෙහි පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව යම් භාණ්ඩවල සිල්ලර හෝ තොග මිල ඉහළ දැමීම , මිල දර්ශන ප්‍රදර්ශනය නොකිරීම , මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් නොකිරීම, නොමඟ යැවීම හෝ වංචාකාරී කටයුතු සිදුකිරීම හෝ නිෂ්පාදකයින් / වෙළෙඳුන් විසින් සිදුකරන ලද ව්‍යාජ නියෝජන වැටලීමට ලක් කිරීම සහ විමර්ශනය කිරීම. වංචාකාරී වෙළෙඳුන්ට අදාලව පනතෙහි 60 වන වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පැවරීම සහ දඩ මුදල් නියම කිරීම සිදු කරනු ලැබේ.

**වගු අංක -2 - වෙළඳපොල වැටලීම් සහ දඩ මුදල් නියම කිරීම්වල ප්‍රගතිය**

| සිදුකරන ලද ක්‍රියාකාරකම් (ඉලක්ක) | වැටලීම් සංඛ්‍යාව | සිදුවීම් සංඛ්‍යාව | නියම කරන ලද දඩ (රුපියල්) |
|---|---|---|---|
| - 10 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (10 වන වගන්තියෙහි දක්වන ලද උපදෙස් උල්ලංඝනය කිරීම) | **9,825** | **9,081** | **37,434,800** |
| - 11 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (භාණ්ඩයේ සඳහන් මිලට වඩා ඉහළ මිලකට අලෙවි කිරීම) | **1,044** | **871** | **2,856,600** |
| 12 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ප්‍රමිතීන්ට අනුකූල නොවීම) | **122** | **134** | **628,500** |
| - 15 වන වගන්තිය සම්බන්ධ වෙළෙඳපොළ විමර්ශන | **37** | **7** | **12,000** |
| - 16 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ඕනෑම භාණ්ඩයක් සන්තකයේ තබාගැනීම ප්‍රතික්ෂේප කිරීම) | **17** | **31** | **80,000** |
| - 17 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (භාණ්ඩ සඟවා තබාගැනීම) | **0** | **0** | **0** |
| - 18 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (උපරිම සිල්ලර මිල පවත්වාගෙන යාම උල්ලංඝනය කිරීම) | **15** | **32** | **82,500** |
| - 20 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන | **2,331** | **2,023** | **8,402,500** |

| | | | |
|---|---|---|---|
| - 26 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (මිල දර්ශනය ප්‍රදර්ශනය නොකිරීම) | **6,909** | **7,189** | **20,692,400** |
| - 28 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (වෙළෙන්දන් විසින් මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් කිරීම.) | **19** | **17** | **501,000** |
| - 30 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (නොමඟ යැවීම සහ වංචාකාරී කටයුතු) | **2,504** | **2,698** | **13,904,600** |
| - 30 සහ 31 වන වගන්ති යටතේ වෙළෙඳපොළ විමර්ශන (නොමඟයැවීම සහ ව්‍යාජ නියෝජන) | **1,719** | **1,705** | **8,843,900** |
| - 31 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන - (ව්‍යාජ නියෝජන) | **1,063** | **1,283** | **4,836,350** |
| **මුළු වැටලීම් සහ දඩ නියම කිරීම්** | **25,605** | **25,071** | **98,275,150** |

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරන ලද විශේෂ වැටලීම්</u>**



වංචනික ලෙස ලේබල් කර තිබූ රූපලාවන්‍ය ද්‍රව්‍ය විශාල තොගයක් සම්බන්ධයෙන් වැටලීමක් සිදුකිරීම.



කල් ඉකුත් වූ ආහාර පිසීමට භාවිතා කරන තෙල් තොගයක් සම්බන්ධයෙන් වැටලීමක් සිදුකිරීම







පරිභෝජනයට නුසුදුසු සුදුළූණු කිලෝග්‍රෑම් 50,000 ක් සම්බන්ධයෙන් වැටලීමක් සිදුකිරීම.

වංචනික ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය (SLS certification) ලේබලයෙහි සටහන් කරන ලද පානීය ජල බෝතල් සම්බන්ධයෙන් වැටලීමක් සිදුකිරීම

<u>**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරන ලද වැටලීම්**</u>




<u>**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පනවන ලද දඩ මුදල්**</u>




**3. අසාධාරණ වෙළඳ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වූ පාරිභෝගිකයින්ට සහන සැලසීම**

අ. පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

පාරිභෝගික අධිකාරි පනතෙහි 13 වන සහ 32 වන වගන්ති යටතේ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වේ. නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ලබාදෙන ලද බලපත්‍රයට හෝ ඇප සහතිකය සම්බන්ධ කරුණු හෝ වෙනත් දෑ සමඟ අනුකූල නොවන පරිදි භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමර්ශන කළහැකිය.

**වගු අංක 3 සහ 4** මගින් පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ 2017 වර්ෂයේදී අත්කර ගන්නා ලද ප්‍රගතිය දැක්වේ.

| | **මුළු සංඛ්‍යාව** |
|---|---|
| ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | 2301 |
| (අ). තැපෑලෙන් | 1989 |
| (ආ). දුරකථන ඇමතුම් මගින් | 312 |
| වැටලීම් ( ප්‍රධාන කාර්යාලය/දිස්ත්‍රික් කාර්යාල ) | 95 |
| වෙනත් ආයතන වෙත යොමුකරන ලද | 211 |
| විමර්ශන සඳහා යොමු කරන ලද පැමිණිලි | 512 |
| පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡා සහ විමර්ශන වලට පෙර පැවැත්වූ සාකච්ඡා | 1129 |
| අවසන් කරන ලද සාකච්ඡා (අදාළ ගොනු අවසන් කළ) | 520 |

(පූර්ව වර්ෂයේ පැමිණිලි ද ඇතුළත්ව )

වගු අංක – 4 - පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන :

| පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන | |
|---|---|
| විමර්ශන සංඛ්‍යාව | 611 |
| පූර්ව මාසයේ / වර්ෂයේ සිට සිදු කෙරෙන විමර්ශන | 338 |
| නව විමර්ශන | 273 |
| විසඳුම් ලබා දෙන ලද විමර්ශන | 127 |
| නිකුත් කරන ලද නියෝග | 122 |

(පූර්ව වර්ෂයේ පැමිණිලිද ඇතුළත්ව )

<u>අධිකරණ නඩු</u>

| වර්ගය | **2017** |
|---|---|
| අනුකූලතා සහ බලාත්මකකිරීම් අංශය විසින් ගොනු කරන ලද නව නඩු | 59 |
| අධිකරණයෙහි පෙනී සිටීම | 479 |
| දඩ මුදල් (අධිකරණ නඩු මඟින් ලද) | රු. 130,000/- |
| විභාග කරන ලද නඩු | 106 |

## 4. පාරිභෝගික අධ්‍යාපනය සහ බල ගැන්වීම

අ. පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය, සම්මන්ත්‍රණ සහ වැඩමුළු, ප්‍රදර්ශන ආදිය මඟින් පාරිභෝගික අයිතීන් සහ වගකීම් , වර්තමාන පාරිභෝගික නීතිය යහපත් පාරිභෝගික වටිනාකම්, සහ යහපත් ව්‍යාපාරික පිළිවෙත් ආදිය පිළිබඳව දැනුවත් කරනු ලැබේ. මීට අමතරව පාරිභෝගික අයිතිවාසිකම් දිනය පාරිභෝගික කණ්ඩායම් සහ ව්‍යාපාරික ප්‍රජාව සමඟ එක්ව සමරනු ලැබේ. පාරිභෝගික අයිතිවාසිකම් සහ පනතෙහි නීති රීති සම්බන්ධයෙන් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **වගු අංක 5 - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙහෙයවන ලද දැනුවත්කිරීමේ වැඩසටහන්**

| පළාත | දිස්ත්‍රික්කය | ව්‍යාපාරික දැනුවත්කිරීම් | සාමාන්‍ය ජනතාව දැනුවත්කිරීම් | පාසැල් ශිෂ්‍ය දැනුවත්කිරීම් |
|---|---|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 10 | 8 | 1 |
| | මාතලේ | 13 | 2 | - |
| | නුවරඑළිය | 8 | 14 | 6 |
| නැගෙනහිර පළාත | අම්පාර | 18 | 05 | 10 |
| | මඩකලපුව | 2 | 11 | 8 |
| | ත්‍රිකුණාමලය | 14 | 20 | 12 |

| | | | | |
|---|---|---|---|---|
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 4 | 13 | - |
| | පොළොන්නරුව | 10 | 13 | 5 |
| උතුරු පළාත | යාපනය | 1 | 15 | 11 |
| | කිලිනොච්චි | 7 | 6 | 2 |
| | මන්නාරම | 15 | 5 | 5 |
| | මුලතිව් | 29 | 14 | 6 |
| | වව්නියාව | 12 | 8 | 5 |
| වයඹ පළාත | කුරුණෑගල | 2 | 11 | 3 |
| | පුත්තලම | 6 | 16 | 1 |
| සබරගමු පළාත | කෑගල්ල | - | 3 | 1 |
| | රත්නපුර | 3 | 9 | 2 |
| දකුණු පළාත | ගාල්ල | 7 | 11 | 1 |
| | හම්බන්තොට | 9 | 16 | 4 |
| | මාතර | 5 | 3 | 7 |
| ඌව පළාත | බදුල්ල | 4 | 9 | 3 |
| | මොණරාගල | 2 | 1 | 2 |
| බස්නාහිර පළාත | කොළඹ | 26 | 32 | 8 |
| | ගම්පහ | 3 | 1 | - |
| | කළුතර | 4 | 9 | 2 |
| **මුළු සංඛ්‍යාව** | | **214** | **255** | **105** |

**වගු අංක – 6 - පාරිභෝගික සංවිධාන ස්ථාපනය කිරීම**

| පළාත | දිස්ත්‍රික්කය | ස්ථාපනය කරන ලද පාසල් පාරිභෝගික සංවිධාන සංඛ්‍යාව | ලියාපදිංචි කරන ලද පාසල් පාරිභෝගික කව සංඛ්‍යාව | ස්ථාපනය කරන ලද පාරිභෝගික සංවිධාන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | - | - | 1 |
| | මාතලේ | - | - | - |
| | නුවරඑළිය | 2 | 1 | 3 |
| නැගෙනහිර පළාත | අම්පාර | - | 2 | 2 |
| | මඩකලපුව | 6 | 9 | 2 |
| | ත්‍රිකුණාමලය | 2 | 2 | 1 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | - | - | - |
| | පොළොන්නරුව | 3 | - | - |
| උතුරු පළාත | යාපනය | 1 | 1 | - |
| | කිලිනොච්චි | 1 | 3 | - |
| | මන්නාරම | 5 | 11 | - |

| | | | | |
|---|---|---|---|---|
| | මුලතිව් | 1 | 3 | 1 |
| | වව්නියාව | 4 | 1 | 1 |
| වයඹ පළාත | කුරුණෑගල | 1 | - | 1 |
| | පුත්තලම | 1 | - | - |
| සබරගමු පළාත | කෑගල්ල | - | - | 1 |
| | රත්නපුර | - | - | - |
| දකුණු පළාත | ගාල්ල | - | - | - |
| | හම්බන්තොට | 1 | - | 3 |
| | මාතර | - | - | - |
| ඌව පළාත | බදුල්ල | - | - | - |
| | මොණරාගල | - | - | - |
| බස්නාහිර පළාත | කොළඹ | - | - | 2 |
| | ගම්පහ | - | - | 5 |
| | කළුතර | - | - | 1 |
| **මුළු සංඛ්‍යාව** | | **28** | **33** | **24** |

<u>**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පවත්වන ලද දැනුවත්කිරීමේ වැඩසටහන්**</u>



පොල් සංවර්ධන අධිකාරිය සහ පොල් වගා මණ්ඩලය සමඟ විශේෂ සාකච්ඡාවක් පවත්වමින්




කොළඹ බණ්ඩාරනායක අනුශ්මරණ ජාත්‍යන්තර ශාලාවේ දී පැවැත්වුණු ශිල්ප අභිමානී -2017 V ප්‍රදර්ශනයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කුටිය



ව්‍යාපාරිකයින් දැනුවත්කිරීමේ වැඩසටහන් පවත්වමින්



දිස්ත්‍රික්ක මට්ටමෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින්

**5.** වෙළෙන්දන් සහ නිෂ්පාදකයින් ප්‍රති තරඟකාරී කටයුතු වලින් ආරක්ෂා කිරීම සහ යහපත් තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.

| ක්‍රියාකාරකම | මුළු සංඛ්‍යාව |
|---|---|
| <u>වෙළඳ පැමිණිලි පිළිබඳ විමර්ශන</u><br>ප්‍රති තරඟකාරී මෙන්ම අසාධාරණ වෙළඳ කටයුතු සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත යොමු කළ පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වීම<br>• පෙර යොමුකරන ලද පැමිණිලි<br>• අදාළ කාලය තුළදී ලද පැමිණිලි<br>• සභාව වෙත යොමු කරන ලද පැමිණිලි<br>• වර්ෂය තුළ ඉවත් කරන ලද පැමිණිලි<br>දැනට කටයුතු කරනු ලබන පැමිණිලි | 04<br>29<br>01<br>24<br>08 |
| <u>සැමදෙනාටම සාර්ථක වීම සඳහා අවස්ථා උදාකරමින් තරඟකාරීත්වය වැඩි කිරීම</u><br>2007/07/11 දින නිකුත් කළ අංක 1505/15 දරන ගැසට් නිවේදනය මඟින් හඳුනා ගන්නා ලද නිෂ්පාදන පහක් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම | 321 |

| | |
|---|---|
| • ලැබූ අයදුම්පත් සංඛ්‍යාව<br>• අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම | 321 |
| <u>අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පරීක්ෂාකිරීම</u><br>• කොළඹ සහ තදාසන්න ප්‍රදේශ පදනම් කරගත් 18/20 වගන්තියේ වාර්තාව<br>• දිස්ත්‍රික් මට්ටමෙන් විශ්ලේෂණය සහ වාර්තාකිරීම | 12<br><br>11 |
| <u>ආහාර ද්‍රව්‍යවල මිල පරීක්ෂාකිරීම</u><br>එළවළුවල දෛනික සිල්ලර මිල දැක්වෙන වාර්තා<br>(නිෂ්පාදන 25)<br>පළතුරුවල දෛනික සිල්ලර මිල දැක්වෙන වාර්තා<br>(නිෂ්පාදන 15)<br>අත්‍යවශ්‍ය භාණ්ඩවල සිල්ලර මිල දැක්වෙන වාර්තා (නිෂ්පාදන 25)<br>මාළුවල සිල්ලර මිල දැක්වෙන වාර්තා<br>විශේෂ මිල වාර්තා | 276<br>141<br>276<br>224<br>151 |
| පර්යේෂණ අධ්‍යයන | 02 |
| විශේෂ අධ්‍යයන | 04 |
| දැනුවත්කිරීම් පැවැත්වීම | වැඩසටහන් 08 |

**අන්තර්ක්‍රියාකාරීත්ව ජංගම සේවය (1977)**

අන්තර් ක්‍රියාකාරීත්ව ජංගම දුරකථන ප්‍රතිචාර සේවාව තුළින් (කෙටි කේතාංක 1977) පුරවැසියන් වෙත සිල්ලර මිල තොරතුරු ලබා දෙනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් ස්වකීය කෙටි කේතාංක දුරකථන අංකය වන 1977 භාවිතාකර සිල්ලර වෙළඳපොළවල එළවළු, පළතුරු සහ ආහාර ද්‍රව්‍ය සිල්ලර මිල ගණන් දෛනිකව මෙම තොරතුරු පද්ධතියට අඛණ්ඩව ඇතුළත් කරන ලදී. (කොළඹ, පිටකොටුව, දෙමටගොඩ, බොරැල්ල, නුගේගොඩ සහ වැල්ලවත්ත). පැලියගොඩ මාළු වෙළඳපොළෙන් මාළු මිල ගණන් ලබා ගැනේ. මෙම දත්ත දෛනිකව අදාළ පද්ධතියට ඇතුළත් කරනු ලැබේ. මෙමඟින් පාරිභෝගිකයන්ට තමන්ට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ දී දැනුවත්භාවයෙන් යුතුව තීරණ ගතහැකිය.

**වෙනත් නියාමන අධිකාරීන් සහ පාර්ශවකාර සංවිධාන සමඟ ඵලදායී සම්බන්ධතා ඇතිකරගැනීම සහ පවත්වා ගැනීම**

**01) මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය**

**අ. පරිසර ආරක්ෂණය සඳහා වන අමාත්‍යාංශ කමිටු**

- ජාතික මෙහෙයුම් කමිටුව (බැසිල් / රොටර්ඩෑම්/ ස්ටොක්හෝම් සමුළු / මිනමාටා සමුළුව)

- ජාතික සම්බන්ධීකරණ කමිටුව
- ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ
- ජාතික විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති කමිටුව
- ගෝලීය සුසංවාදීකරණ පද්ධති සමාලෝචන කමිටුව (HS කේතාංකය )
- අන්තර් ආයතන විශේෂඥ කාර්ය කණ්ඩායම (IAEWG) – SWITCH ASIA වැඩසටහන
- තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතිය

**ආ. මධ්‍යම පරිසර අධිකාරිය**

- රසායනික ද්‍රව්‍ය නිසි කළමනාකරණය සඳහා ජාතික ක්‍රියාත්මක සැලසුම සමාලෝචනය කිරීමේ කමිටුව.
- TACMIC – කාර්මික රසායනික කළමනාකරණය සඳහා වන තාක්ෂණික උපදේශන කමිටුව

02) **ජන සන්නිවේදන සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය**

GIC 1919 සඳහා වන මෙහෙයුම් කමිටු සාමාජික (PSC)

03) **ශ්‍රී ලංකා රේගුව**

රේගුවේ තනි කවුළු පද්ධතිය සමඟ සම්බන්ධ වීම.

04) **වෙළෙඳ සංගම් සහ කර්මාන්ත මණ්ඩල**

තරඟකාරිත්වය සහතිකකිරීම කර්මාණ්තවලට සහයෝගය ලබා දීම පිණිස මිත්‍රශීලී සම්බන්ධතා පවත්වාගැනීම

**05) සෞඛ්‍ය අමාත්‍යාංශය**

1. ආහාර උපදේශක කමිටු සාමාජික

   ජාතික ඖෂධ නියාමන අධිකාරිය **(NMRA)**
2. දේශසීමා නිෂ්පාදන ඇගයීම් කමිටු සාමාජික

   ජාතික ඖෂධ නියාමන අධිකාරිය
3. රූපලාවන්‍ය ද්‍රව්‍ය ඇගයීමේ උප කමිටුව

   ජාතික ඖෂධ නියාමන අධිකාරිය

**06) ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

ප්‍රතිපත්ති උපදේශක කමිටුව

**07) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**

ආහාර නිෂ්පාදන පිළිබඳ ආංශික කමිටුව ISO-Copolco Committee
ජාතික විද්‍යුත් තාක්ෂණ කමිටුව

**08) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**

උපදේශක කමිටු රැස්වීම

**09)** **ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය**
මෙහෙයුම් කමිටුව

**10)** **පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්, කෘෂිකර්ම අමාත්‍යාංශය**
කාර්මික පළිබෝධනාශක උප කමිටුව

**11)** **අපනයන සංවර්ධන මණ්ඩලය**
ජාතික අපනයන ක්‍රමෝපායයන්

**12)** **නිෂ්පාදන සහතිකකිරීමේ උපදේශක කමිටුව**
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

**13)** **මුදල් අමාත්‍යාංශය**
ජීවන වියදම් කමිටු රැස්වීම

**සාධාරණ මිලකරණය සහතිකකිරීම**

**අ. නිශ්චිත භාණ්ඩවල මිල නියාමනය**

පනතෙහි 18, 19 සහ 20 වගන්ති මඟින් පවරා ඇති බලතල අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හඳුනාගත් භාණ්ඩවල වෙළෙඳපොළ මිල සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කරයි. තෝරාගත් භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියමකිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත අංක 7 වගුව මඟින් දැක්වේ.

වගු අංක **– 7 -** තෝරාගත් භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියමකිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග

| **භාණ්ඩය** | **ගන්නා ලද පියවර** |
|---|---|
| සිමෙන්ති | සිමෙන්ති සඳහා වන අයදුම්පත්‍ර 06 කට තීරණ ලබාදී ඇත. |
| යොදය සහිත කිරිපිටි | යොදය සහිත කිරිපිටි සඳහා වන අයදුම්පත්‍ර 05 කට තීරණ ලබාදී ඇත. |
| ළඳරු කිරිපිටි | ළඳරු කිරිපිටි සඳහා වන අයදුම්පත්‍ර 01 කට තීරණ ලබාදී ඇත. |

**අතුරු නියෝග**

| භාණ්ඩය | අයදුම්පත්‍ර සංඛ්‍යාව |
|---|---|
| සිමෙන්ති | 05 |
| ළදරු කිරි පිටි | 03 |
| ගෑස් | 08 |

**අ. ආයතනය තුළ ශක්‍යතා සංවර්ධනය**

අ. . සේවක සංවර්ධනය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සේවකයින් අදාළ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය වීම ස්වකීය සේවාවන් ඉහළ නැන්වීම සඳහා දායකත්වය සපයන ආයෝජනයක් වශයෙන් සලකනු ලැබේ. 2017 වර්ෂයේදී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත වගු අංක 8 මගින් දැක්වේ.

**වගු අංක– 8 - 2017 වර්ෂයේදී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන වැඩසටහන්**

| # | පාඨමාලාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පස්වන BRICS ජාත්‍යන්තර තරඟ සමුළුව - බ්‍රසීලය | 01 |
| 02 | AAT සමුළුව 2017 | 01 |
| 03 | ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාව 2016/2017 | 01 |
| 04 | විධායක ලේකම් සහ පරිපාලන පරිචය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 01 |
| 05 | “පාරිභෝගික කටයුතු වැඩිදියුණුකිරීම සහ විශේෂීකරණය, පිළිබඳ අධිශිෂ්‍යත්ව වැඩසටහන - කොරියාව | 01 |
| 06 | නව පත්වීම් ලද විමර්ශන නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව | 50 |
| 07 | “නීති සහ රෙගුලාසි අනනුකූලතාව” පිළිබඳ ජාත්‍යන්තර තාක්ෂණික වැඩමුළුව | 01 |

| | | |
|---|---|---|
| 08 | "ව්‍යවසායකත්ව ව්‍යාපෘතිය සහ සංවිධාන කළමනාකරණය" පිළිබඳ ජාත්‍යන්ර පුහුණු වැඩසටහන - තායිලන්තය | 02 |
| 09 | සමස්ත කළමනාකරණය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලාව–මැලේසියාව | 01 |
| 10 | නව දේශීය ආදායම් පනත පිළිබඳ සම්මන්ත්‍රණය | 03 |
| 11 | ආහාර සම්බන්ධ නීති රීති පිළිබඳ සම්මන්ත්‍රණය | 05 |
| 12 | උපද්‍රව පිටුදැකීම සහ උපද්‍රව සඳහා පිළියම් පිළිබඳ විශේෂ දේශනය | 03 |
| 13 | විනය කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 |
| 14 | ගිණුම් ලිපිකරුවන්ගේ රාජකාරි සහ වගකීම් පිළිබඳ පුහුණු වැඩසටහන | 02 |
| 15 | පාරිභෝගික ආරක්ෂාව උදෙසා යහපත් කෘෂිකාර්මික මෙන්ම පසු අස්වනු කටයුතු පිළිබඳ වැඩමුළුව | 01 |
| 16 | ජනමාධ්‍ය භාවිතය පිළිබඳ වැඩමුළුව | 01 |
| | **මුළු පාඨමාලා සංඛ්‍යාව** | **75** |

**ආ.** අධිකාරියේ සේවක මණ්ඩලය ශක්තිමත්කිරීම

| වැටුප් කේතාංකය | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සේවයේ නිරත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| **HM 2-1** | **ජ්‍යෙෂ්ඨ කළමනාකරු** | | |
| | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 |
| **HM 1-1** | අධ්‍යක්ෂ | 6 | 6 |
| | සභා ලේකම් | 1 | 1 |
| **MM 1-1** | **කළමනාකරු** | | |
| | අභ්‍යන්තර විගණක | 1 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 15 | 5 |
| | සහකාර අධ්‍යක්ෂ | | 3 |

| | | | |
|---|---|---|---|
| | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ-ප්‍රාදේශීය | 9 | 8 |
| **JM 1-1** | **කණිෂ්ඨ කළමනාකරු** | | |
| | විගණන නිලධාරී | 2 | 1 |
| | පද්ධති පාලක | 1 | 1 |
| | ජ්‍යෙෂ්ඨ පරීක්ෂණ නිලධාරී | 27 | 25 |
| | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ වෙළඳ පර්යේෂක සහ විශ්ලේෂක | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී | 2 | 1 |
| | රහස්‍ය ලේකම් (ක්ෂ ජෙනරාල්අධ්‍ය) | 1 | 0 |
| | රහස්‍ය ලේකම් (සභාපති) | 1 | 1 |
| | ජ්‍යෙෂ්ඨ පරිපාලන මානව සම්පත් නිලධාරී / | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ නීති සහ බලගැන්වීම් නිලධාරී | 2 | 1 |
| | ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරී | 1 | 1 |
| **MA 5-2** | **බලගැන්වීම් / මෙහෙයුම්/ සේවා දිගු** | | |
| | දත්ත සම්බන්ධීකාරක | 1 | 1 |
| | සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 1 |
| | වෙළෙඳපොළ පර්යේෂණ විශ්ලේෂක | 1 | 1 |
| | ප්‍රලේඛන නිලධාරී | 6 | 4 |
| | පුස්තකාලයාධිපති | 1 | 1 |
| | පිරිවැය නිලධාරී | 15 | 2 |
| | ගිණුම් නිලධාරී | | 6 |
| | පරිපාලන නිලධාරී | 5 | 3 |
| | නීති සහ බලගැන්වීම් නිලධාරී | 3 | 3 |
| | විමර්ශන නිලධාරී | 200 | 224 |
| **වැටුප් කේතාංකය** | **තනතුර** | **අනුමත සේවක සංඛ්‍යාව** | **දැනට සේවයේ නිරත සේවක සංඛ්‍යාව** |
| **MA 2-2** | **කළමනාකරණ සහකාර (තාක්ෂණ)** | | |
| | පොත් තබන්නා | 1 | 0 |
| **MA 1-2** | **කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)** | | |
| | කළමනාකරණ සහකාර | 31 | 31 |
| **PL 3** | **ප්‍රාථමික මට්ටමේ කුසලතා සහිත** | | |
| | රියදුරු | 18 | 24 |
| **PL 1** | **ප්‍රාථමික මට්ටමේ කුසලතා රහිත** | | |
| | කාර්යාල කාර්ය සහායක | 14 | 13 |

| | එකතුව | **370** | **370** |
|---|---|---|---|

**ඇ. කාර්යමණ්ඩල අභිප්‍රේරණය සහ සුබසාධනය**

සමාලෝචිත වර්ෂය තුළදී සේවකයින්ට ප්‍රසන්න මෙන්ම සේවයට හිතකර වාතාවරණයක් සැපයීම සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, ආගමික සහ සංස්කෘතික වැඩසටහන්, සේවක දිරිදීමනා ක්‍රමය, සේවක සංවර්ධන වැඩසටහන් සහ සේවක හඳුනාගැනීම් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**ඇ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත සඳහා සංශෝධන**

ඉදිරිපත් වූ යෝජනා සලකා බලා හේතු / තාර්කික සහිතව සංශෝධන සම්බන්ධයෙන් අවසන් තීරණ ගන්නා ලදී.

**පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව**

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අතර, අධිකාරිය විසින් සභාව වෙත කරනු ලබන යොමුකිරීම්, ප්‍රධාන වශයෙන් ප්‍රතිතරඟකාරීත්ව චර්යාවන් ආශ්‍රිත ක්ෂේත්‍රයන් නිශ්චය කිරීම සඳහා පනත මඟින් බලය පවරා තිබේ.පනතේ විධිවිධාන ප්‍රකාර අධික මිල ගණන්, වෙළෙඳපොළ අඩුපාඩු සහ වෙළෙඳපොළ හැසිරවීම් විමර්ශන කටයුතු සඳහා සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවන්හිදී භාණ්ඩ අලෙවි කළයුතු මෙන්ම සේවා සැපයිය යුතු මිල ගණන් නිර්දේශ කිරීමට සභාව වෙත බලය පැවරී තිබේ.

**පැමිණිලි / නිර්දේශ**

| ක්‍රියාකාරකම | පැමිණිලි සංඛ්‍යාව | |
|---|---|---|
| | ලැබූ පැමිණිලි සංඛ්‍යාව | තීන්දුව ලබාදුන් / විසඳූ හෝ වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව (පූර්ව වර්ෂය ද ඇතුළත්ව) |
| ජනතා අභිලාෂයට විරුද්ධව ක්‍රියාත්මක වන ප්‍රතිතරඟකාරී ක්‍රියාකාරකම් සමනය කිරීම තහවුරු කිරීම. | 03 | නිෂ්ප්‍රභා කළ – 02<br>විසඳීමට ඇති – 01 |

| | | |
|---|---|---|
| | | විනිශ්චය ලබා දී ඇති – 01<br>(CAC/51/2016) |
| භාණ්ඩ හා සේවා සඳහා උපරිම මිල නිර්දේශ කිරීම | 11 | නිර්දේශ ලබා දී ඇති - 09 |
| අධික මිල ගණන් සම්බන්ධයෙන් විමර්ශන සිදුකිරීම | 02 | නිර්දේශ ලබා දී ඇති - 01 |

(පූර්ව වර්ෂයේ පැමිණිලි ද ඇතුළත්ව)

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | **2017.12.31** දිනට | **2016.12.31** දිනට |
|---|---|---|
| <u>වත්කම්</u> | **රුපියල් 000'** | **රුපියල් 000'** |
| **ජංගම වත්කම්** | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 52,317 | 15,354 |
| වෙළඳ සහ අනෙකුත් ලැබීම් | 31,984 | 18,385 |

| | | |
|---|---|---|
| භාණ්ඩ ලැයිස්තු / තොග | 1,062 | 1,031 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 7,215 | 5,523 |
| | **92,578** | **40,294** |
| ක්‍රියාත්මක කාර්යයන් (සංවර්ධන පියවර) | 121 | 121 |
| **ජංගම නොවන වත්කම්** | | |
| ආයෝජන | 230,520 | 218,495 |
| පාරිතෝෂික අරමුදල ආයෝජන ගිණුම | 20,633 | 18,737 |
| ජංගම නොවන වෙනත් මූල්‍ය වත්කම් (කාර්ය මණ්ඩල ණය) | 12,864 | 6,333 |
| කල්බදු පදනමට ගත් ගොඩනැගිලි | 825 | 850 |
| දේපළ, පිරියත සහ උපකරණ | 63,879 | 86,123 |
| | **328,721** | **330,538** |
| **මුළු වත්කම්** | **421,419** | **370,953** |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත වගකීම් | 39,695 | 32,361 |
| ගෙවියයුතු සහ අනෙකුත් වගකීම් | 12,255 | 2,199 |
| | **51,950** | **34,561** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 50,071 | 45,579 |
| **මුළු වගකීම්** | **102,021** | **80,140** |
| **මුළු ශුද්ධ වත්කම්** | **319,398** | **290,813** |
| **ශුද්ධ වත්කම්/ හිමිකම්** | | |
| සමුච්චිත අරමුදල | 63,191 | 63,191 |
| විලම්භිත ආදායම | 49,545 | 71,790 |
| සංචිත | 206,662 | 155,832 |
| | **319,398** | **290,813** |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | **319,398** | **290,813** |

මූල්‍ය ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි පූර්ණ කොටසක් වේ. මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් තබන ලදී.

| | | |
|---|---|---|
| මූල්‍ය අධ්‍යක්ෂ<br>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | අධ්‍යක්ෂ ජනරාල්<br>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | සභාපති<br>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | 2017 | 2016 |
|---|---|---|
| | රුපියල් 000' | රුපියල් 000' |

| | | |
|---|---|---|
| **ආදායම්** | | |
| පුනරාවර්තන ප්‍රදාන | 380,652 | 292,000 |
| දඩ මුදල් මඟින් ලද ආදායම් | 32,758 | 29,900 |
| වෙනත් ආදායම් | 62,164 | 50,863 |
| | **475,575** | **372,763** |
| **වියදම්** | | |
| පුද්ගල වේතන | (255,697) | (221,336) |
| ප්‍රවාහන | (12,480) | (12,895) |
| සැපයුම් සහ පරිභෝජන | (11,859) | (10,605) |
| නඩත්තු කටයුතු | (8,643) | (9,782) |
| ගිවිසුම්ගත සේවා | (54,024) | (42,115) |
| ක්ෂයවීම් | (37,416) | (33,410) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (44,568) | (35,803) |
| මූල්‍ය පිරිවැය | (57) | (136) |
| මුළු වියදම් | **(424,744)** | **(366,083)** |
| | **50,831** | **6,681** |
| වත්කම් අපහරණයෙන් ලද අලාභය | - | (21) |
| **කාල පරිච්ඡේදය සඳහා පූර්ණ ශුද්ධ අතිරික්තය /(ඌන)** | **50,831** | **6,660** |

**පාරිභෝගික කට යුතු පිළිබඳ අධිකාරිය**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

| | 2017 | 2016 |
|---|---|---|
| | රුපියල් 000' | රුපියල් 000' |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය ක්‍රියාවලින් ලද අතිරික්තය/ (හිඟය) | **50,831** | **6,681** |

| | | |
|---|---|---|
| වත්කම් අපහරණයෙන් ලාභ /(අලාභ) | - | (21) |
| **ගැළපුම්** | | |
| ක්ෂයවීම් | 37,416 | 33,410 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 7,211 | 6,939 |
| ක්‍රමක්ෂය | 25 | 25 |
| අස්පෘශ්‍ය වත්කම් ඉහළයාම (ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන්) | - | 1,481 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **95,483** | **48,515** |
| ගෙවිය යුතු වියදම් පහළයාම | 17,389 | 3,210 |
| වෙනත් ජංගම වත්කම් ඉහළයාම | (15,322) | (599) |
| පාරිතෝෂික ගෙවීම් | (2,720) | (1,506) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **94,830** | **49,620** |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | (15,171) | (12,208) |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | (1,896) | (1,057) |
| ආයෝජන ඉහළයාම | (12,025) | (23,314) |
| දීර්ඝ කාලීන ණය පහළයාම් (සේවක ණය) | (6,530) | 1,956 |
| **ආයෝජන කටයුතු මඟින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(35,622)** | **(34,623)** |
| **මූල්‍ය කටයුතු මඟින් ලද මුදල් ප්‍රවාහය** | | |
| භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන | 15,171 | 12,000 |
| ක්ෂයවීම් | (37,416) | (33,410) |
| විලම්භිත ආදායම | (22,245) | (21,410) |
| **මූල්‍ය කටයුතු මඟින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(22,245)** | **(21,410)** |
| **මුදල් හා මුදල් සමාන ද්‍රව්‍යයන්හි ශුද්ධ ඉහළයාම් (පහළයාම)** | **36,963** | **(6,411)** |
| **කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | **15,354** | **21,765** |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | **52,317** | **15,354** |

## ගිණුම්කරණ සටහන්

**1.** ඒකාබද්ධ තොරතුරු

**1.1** 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත , 1987 අංක 1 දරන පාරිභෝගික සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ මිල පාලන පනත (173 පරිච්ඡේදය) අවලංගු කරමින් 2003 අංක 09 දරන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

2011 සැප්තැම්බර් මස 15 වන දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක.PED/58/02 ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය "A" කාණ්ඩයේ නියාමන නියෝජිතායතන අතර "A" උප කාණ්ඩයට අයත්වේ.

**1.2 ප්‍රමුඛ කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය**

අධිකාරියේ ප්‍රධාන කාර්යය වන්නේ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ වෙළඳාම විධිමත් කිරීමයි.

**1.3** 2017 වර්ෂය අවසාන වන විට අධිකාරියේ සේවක සංඛ්‍යාව 383 ක් විය.

**1.4 වැදගත් කොටස් හිමිකාරීත්වය / හිමිකම්**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදලින් යැපෙන ආයතනයකි. අධිකාරිය වෙත සෘජුවම ලැබෙන ආදායමක් වූ දඩ මුදල් ආදායමෙන් 1/3 ක මුදලින් ඇති කරන ලද අරමුදලේ ශුද්ධ ශේෂය මඟින් ද අධිකාරියේ හිමිකම් නිරූපණය කෙරේ.

**1.5 රජයේ ප්‍රදාන**

ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් පවතින විට එය රජයේ ප්‍රදානයක් වශයෙන් හඳුනාගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයන් හා සම්බන්ධයක් පවතී නම් එය වර්ෂය සඳහා වන ආදායම වශයෙන් හඳුනාගැනේ. ප්‍රදානය වත්කමක් සඳහා වන්නේ නම් අදාළ වත්කමෙහි අපේක්ෂිත ඵලදායී ජීවකාලයට සමාන අගයක් ආදායම වශයෙන් සලකා ගණනය කරයි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මූල්‍යමය නොවන ප්‍රදාන ලබන විට එම ප්‍රදානයන් වත්කම්වල නාමික අගයන් වශයෙන් ගැනෙන අතර සමාන වාර්ෂික වාරික වශයෙන් අදාළ වත්කම ප්‍රතිලාභ ලැබීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය අනුව අපේක්ෂිත ජීවකාලය තුළ ලාභ හෝ අලාභ වශයෙන් සටහන් කෙරේ.

රජයේ ප්‍රදාන හා සම්බන්ධ වත්කම් හා මූල්‍ය නොවන ප්‍රදානයන්හි සාධාරණ අගය ශේෂ පත්‍රයෙහි විලම්භිත අදායමක් ලෙස දක්වා ඇත.

**2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්ට (SLPSAS) අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ගිණුම් ප්‍රකාශ පිළියෙළ කර තිබේ.

**2.2** ඓතිහාසික පිරිවැය පදනම සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් පාදක කරගෙන මූල්‍ය ඇස්තමේන්තු සකස් කර තිබේ.

**2.3 දඩ මුදල් ආදායම**

**2.3.1** අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා දඩ මුදල් උපයෝගී කර නොගන්නා බැවින් පෙර ආදායම් ප්‍රකාශන සැකසීමේ දී දඩ මුදල් ආදායම සැලකිල්ලට නොගන්නා ලදී. 2011 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් එකී මුදල් ප්‍රයෝජනයට ගන්නා ලදී. එමනිසා දඩ මුදල් උපයනු ලබන ආදායමක් වශයෙන් සලකන ලද අතර දඩ මුදල් ආශ්රිත සියලු වියදම් සහ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි දක්වා තිබේ.

**2.3.2** අධිකාරිය විසින් දඩ මුදල් ආදායම් වශයෙන් මුදල් ලැබුවද අදාළ වැටලීම සිදුකළ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි නිලධාරියා විසින් ලබා දෙන ලද නඩු අංකයන් අදාළ අධිකරණය විසින් මුදල් එවීමේදී ලබාදෙනු ලබන අංක (තොරතුරු) හා එකිනෙකට වෙනස්වීම හේතුවෙන් ඒවා එම අවස්ථාවේදීම දඩ මුදල් වශයෙන් හඳුනා නොගැනෙන අවස්ථා පවතියි. එම මුදල් සත්‍ය වශයෙන්ම අධිකාරිය සතුවිය යුතු මුදල් ද නැතහොත් අධිකරණ විසින් වැරදීමකින් එවන ලද මුදල්ද යන්න නිවැරදිව දැනගන්නා තෙක් තාවකාලික දඩ මුදල් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ. එබඳු මුදල් ඊළඟ වර්ෂය අවසන් වනතෙක් නිශ්චිතව හඳුනා නොගන්නේ නම් අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණ අරමුදලට බැර කරනු ලැබේ.

**2.3.3** පූර්ව වර්ෂයන්හි අත්දැකීම් අනුව, හඳුනා නොගත් දඩමුදල් ආදායමෙන් ඉතා ඉහළ ප්‍රමාණයක් ලැබියයුතු දඩ මුදල් වශයෙන් නිරූපණය විය.

**2.4** මුදල් වර්ෂය

අධිකාරියේ මූල්‍ය වර්ෂය ලෙස දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය සලකනු ලැබේ.

**3. වත්කම් පදනම සහ ඒවායේ අගය තක්සේරු කිරීම**

**3.1 දේපළ, පිරියත සහ උපකරණ**

**3.1.1.** පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගිණුම් ඇස්තමේන්තු සැකසීම සඳහා ගිණුම් ප්‍රතිපත්ති සහ අනාගත හඳුනාගැනීම ලෙස පිරිවැය ආකෘතිය තෝරාගනියි. (SLPSAS 7)

**3.1.2** දේපළ, පිරියත සහ උපකරණ ආදියෙහි අගය දැක්වීමේ දී ඒවායේ ශුද්ධ සමුච්චිත ක්ෂයවීමට දේපළ, පිරියත සහ උපකරණ කොටස් ප්‍රතිස්ථාපනය කිරීම ද අන්තර්ගත වේ. දේපළ, පිරියත සහ උපකරණ ආදියෙහි අතිශය වැදගත් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට ඇතිවිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස පිළිනොගෙන නව කොටස ආශ්‍රිත ජීවකාලය සහ

ක්ෂයවීම හඳුනා ගනියි. අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ඒවා වැය කරන ලද ආකාරය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වත්කම් ප්‍රත්‍යාගණ සංචිතයෙහි සමුච්චිත හිමිකම් වශයෙන් දැක්වේ.

**3.1.3** වත්කම් අපේක්ෂිත ක්‍රියාකාරී තත්ත්වයට අවශ්‍ය පරිදි සකස් කිරීම සඳහා ඕනෑම වියදමක් දරමින් සිදු කරනු ලබන මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් සඳහා වන පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ සඳහා වැය වන පිරිවැය වේ.

**3.1.4** කාර්යයන් ක්‍රියාත්මකකිරීම හෝ වත්කම්වල ජීවකාලය ඉහළ නැංවීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කරගැනීම, පුළුල්කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම වශයෙන් සලකනු ලැබේ.

**3.1.5 ක්‍රියාත්මක වන කාර්යයන්**

මෘදුකාංග වැඩිදියුණුකිරීම සහ ක්‍රියාත්මකකිරීම සඳහා මෙම මුදල් වියදම් කළ ඇති බව මෙමඟින් දැක්වේ.

| | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.) | අවසන් කළ කාර්යයන් (රු.) (WIP) | 2017.12.31.දිනට අවසන් කළ යුතු / සහතික කළයුතු ශේෂ කාර්යයන් සඳහා (රු.) |
|---|---|---|---|
| මානව සම්පත් මෘදුකාංගය | 165,000.00 | 121,250.00 | 43,750.00 |
| **එකතුව** | **165,000.00** | **121,250.00** | **43,750.00** |

**3.2 ක්ෂයවීම්**

සියලුම වත්කම් අධිකාරියේ භාවිතයට යොදාගත් දිනෙන් ආරම්භ වන මාසයේ සිට ක්ෂය ගණනය කරනු ලැබේ.

**3.2.1** දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ජීවකාලය මත පිරිවැය කපාහැරීමට හැකිවන පරිදි පහත සඳහන් ආකාරයට ගැළපෙන පරිදි ක්ෂය ප්‍රතිපාදන සලසා තිබේ.

| | |
|---|---|
| කාර්යාල ලී බඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යල උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග සහ වෙබ් නිර්මාණ (අස්පෘශ්‍ය වත්කම්) | 20% |
| මෝටර් වාහන | 20% |
| කාර්යාල බෙදා වෙන්කිරීම් | 20% |
| පාරිභෝගික නොවන භාණ්ඩ | 10% |

**3.2.2.** ක්ෂය ගණනය කිරීම් සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සෘජු ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

**3.2.3** පුස්තකාල පොත් සඳහා ක්ෂය කිරීම් සිදුකර නොමැත.

**3.2.4** සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය විලම්භිත ආදායම් ගිණුමට බැර කරනු ලැබේ.

**3.3 ගොඩනැඟිලි පරිශ්‍ර - කුරුණෑගල**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත පවරා ඇති ගොඩනැඟිලි පරිශ්‍රය සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 01 ක මුදල ගෙවීම වර්ෂ 40 කට වැඩි කාලයක් සඳහා ක්‍රමක්ෂය කර තිබේ.

**3.4 ණය ගැතියන් සහ ලැබිය යුතු මුදල්**

උපලබ්ධි වීම සහ ඇස්තමේන්තු කර ඇති වටිනාකම් මත ණයගැතියෝ සහ ලැබියයුතු මුදල් සටහන් කර තිබේ. පහළ අගයට හෝ ශුද්ධ උපලබ්ධි අගයට භාණ්ඩ ලේඛන ගණනය කර තිබේ.

**3.6 මුදල් හා මුදල් සමාන දෑ**

අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, සහ කෙටි කාලීන ආයෝජන මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් අර්ථ දැක්වේ.

**3.6.1** මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දේ යටතට අතැති මුදල් සහ බැංකු තැන්පතු අන්තර්ගත වේ.

**3.7 ස්ථාවර තැන්පතු**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි ස්ථිර තැන්පතු ආයෝජන යටතේ වර්ග කරනු ලැබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අත්දැකීම් අනුව ස්ථිර තැන්පතු අදාළ කාලපරිච්ඡේදය තුළදී ආපසු ලබාගෙන නොමැති අතර ස්ථිර තැන්පතු බහුතරයක් අවම වශයෙන් වසර තුනක් පවතින බවට උපකල්පනය කළ හැකිය. මූලික වශයෙන් ස්ථිර තැන්පතු අගය මත ගණනය කරනු ලැබේ.

**4. වගකීම් සහ ප්‍රතිපාදන**

**4.1 ගෙවියයුතු මුදල්**

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැය මත සඳහන් කර තිබේ.

**4.2 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිශ්චිත විශ්‍රාමික දීමනා සැලසුම් ක්‍රම දෙකක් ඇති අතර එම ක්‍රම දෙක සඳහාම දායකත්වය දැරියයුතුය.

### 4.2.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂිකය

පාරිතෝෂිකය වනාහි නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ ව්‍යවස්වස්ථාවට අනුකූලව අධිකාරිය පාරිතෝෂික ගෙවීමට බැඳී සිටියි. මෙම වගකීම සපුරාලීම සඳහා සේවා කාලයේ පළමු වර්ෂයේ සිට ආරම්භ වී සේවය සපයනු ලබන සෑම වර්ෂයක්ම සඳහා මූල්‍ය වර්ෂයේ අවසන් මස සියලුම සේවකයන්ගේ මාසික වැටුප මත ගණනය කරනු ලබන මුදලට සමාන මුදලත් ශේෂ පත්‍රය යටතේ ප්‍රතිපාදනයක් ලෙස ඉදිරියට ගෙන එනු ලබයි. වර්ෂය ආරම්භයේ දී ඉදිරියට ගෙනා ප්‍රතිපාදන සහ වර්ෂය අවසානයේ දී ඉදිරියට ගෙන ආ ශේෂය අතර වෙනස එය ආදායම් ප්‍රකාශය මඟින් දක්වනු ලැබේ.

පාරිතෝෂික පනත ප්‍රකාර සේවා කාලය අවම වශයෙන් වසරක් සම්පූර්ණ කරන ලද සේවකයින් සඳහා **පාරිතෝෂික** ලබාදීමට ගණනය කරනු ලැබේ. ඒ අනුව 2017.12.31 දිනට වසර 1 සම්පූර්ණ කරන ලද සේවකයින් සඳහා සමුච්චිත ප්‍රදාන රු. 50,070,724.80වේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පාරිතෝෂික ප්‍රදාන වෙන් වශයෙන් ආයෝජනය කිරීමට අනුමැතිය ලබාගෙන ඇති හෙයින්, පාරිතෝෂික සඳහා ආයෝජන ගණනය කරන ලද්දේ සේවා කාලය වසර පහට වැඩි සේවකයින්ය. පහත දැක්වෙන්නේ 2017/12/31 දිනට පාරිතෝෂික ආයෝජනයෙහි සාරාංශය සහ ආයෝජනය කළයුතුව තිබූ ශේෂයයි.

| | රු |
|---|---|
| 2017.12.31 දිනට සේවා කාලය වසර පහට වැඩි සේවකයින් සඳහා | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 42,648,334.47 |
| 2017.01.01. දිනට ආයෝජන | 17,679,313.40 |
| 2017 වර්ෂය සඳහා පවතින ආයෝජන | 8,000,000.00 |
| 2018/01/30 දිනට 2017 වර්ෂය සඳහා කරන ලද ආයෝජන | **25,679,313.47** |
| 2017.12.31 දිනට ආයෝජනය කළ යුතු මුළු ආයෝජන ශේෂය | **16,969,021.00** |

මහා භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් අරමුදල් නිකුත් නොකිරීම හේතුවෙන් ආයෝජනය කළයුතු සමුච්චිත ශේෂයක් තවදුරටත් පවතියි.

### 4.2.2 නිශ්චිත දායක මුදල් සැලසුම්/ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සියලුම සේවකයින් ස්වකීය සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබයි. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර

අරමුදල වෙත සේවකයින් ආවරණය කරමින් ගෙවනු ලබන දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්වා දී තිබේ.

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදල් බලාධිකාරය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 15% සහ 3% බැගින් වූ මුදලක් පිළිවෙළින් දායක කරගනු ලබයි.

**4.3 අවිනිශ්චිත වගකීම්**

2017.12.31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට විරුද්ධව ගොනු කර තිබූ නඩු සංඛ්‍යාව 47 ක් වූ අතර එම නඩු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතෙහි වගන්ති ප්‍රකාරව පහත සඳහන් පරිදි වර්ග කළහැකිය.

| වගන්තිය | නඩු සංඛ්‍යාව |
|---|---|
| **13, 30** | **33** |
| **20(5), 10(1),12(1)** | **14** |

මෙම නඩු අතරින් විශාල ප්‍රමාණයක් ගොනු කර ඇත්තේ පාරිභෝගික අධිකාරිය විසින් පාරිභෝගිකයින් වෙත ලබා දෙන ලද තීරණ වලට එරෙහිවය. ඇතැම් නඩු පාරිභෝගික අධිකාරිය විසින් පළ කරන ලද ගැසට් පත්‍ර සහ ගැසට් පත්‍රයේ පළ කරන ලද වගන්ති වලට විරුද්ධව වේ.

කෙසේ නමුත්, පීඩාවට පත් පාර්ශවයන් රැසක් අධිකාරියේ තීරණය අවලංගු කිරීම, සංශෝධනය කිරීම හෝ පළ කරන ලද ගැසට් පත්‍ර අවලංගු කිරීම අපේක්ෂා කරන බැවින් අනිශ්චිතතා අගය ප්‍රමාණනය කර නොමැත.

**4.4** 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා පාරිභෝගික අධිකාරියේ සේවකයන් වෙත ප්‍රසාද දීමනා ගෙවීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දී තිබේ. මෙම ගෙවීම පවත්නා වර්ෂයේ දී සිදු කරන ලද අතර අනුමැතිය ලබාගැනීම පිළිබඳ අවිනිශ්චිතතාව හේතුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොමැත. පූර්ව වර්ෂයේ ගැළපුම් වලට අනුකූලව මේ වන විට ගෙවීම් ගළපා තිබේ.

**5. ආදායම**

**ආදායම හඳුනාගැනීම**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ගලා ඒ යැයි අපේක්ෂා කරන ආදායම් ප්‍රමාණය හඳුනාගෙන ඇත්නම් ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

**පොළී ආදායම**

නාමික පොළී අනුපාතය භාවිතා කර ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම ගණනය කර සටහන් කරනු ලැබේ (NIR). ස්ථිර තැන්පතු සඳහා පොළී අනුපාතය11% කි. එමනිසා, සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම පසුගිය වසරට වඩා ඉහළ අගයක් ගනියි.

**රජයේ ප්‍රදාන**

රාජ්‍ය ප්‍රදාන සාධාරණව හිමිවේ යැයි සලකා සහ එයට අදාල කොන්දේසි අනුකූලව ඇත්නම් එය රජයේ ආධාර වශයෙන් හඳුනාගැනේ. ප්‍රදාන වියදම් අයිතමයක් සේ සම්බන්ධයක් ඇත්නම් (පුනරාවර්තන ප්‍රදාන) එය එම කාලය සඳහා ආදායමක් ලෙස සලකයි. ප්‍රදාන වත්කම් අයිතමයක් සමඟ සම්බන්ධයක් ඇත්නම් (ප්‍රාග්ධන ප්‍රදාන) එය විලම්භීත ආදායමක් සේ සළකා අදාළ වත්කමෙහි ජීව කාලය පුරා අදායම සමාන අගයන්ගෙන් නිකුත් කෙරේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුදල් නොවන ප්‍රදාන ලබාගන්නා විට වත්කම් සහ ප්‍රදාන දළ වශයෙන් නාමික අගයන් සේ සලකා වත්කමෙහි ජීව කාලය පුරා ආදායම් ප්‍රකාශයට නිකුත් කෙරේ. (IAS 20)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඕ/සීඑජ්/1/17 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2018 ජූලි 31 දින.

සභාපති,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2018 ජූනි 11 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

(ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවත්තේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරිම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ කළ යුත්තේ එය පාවිච්චි කිරීම සඳහා සුදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද, 2017 දෙසැම්බර් 31 වන විටත් අධිකාරියට ලැබී නොතිබුණු රු.2,827,431 ක් වටිනා ජංගම නොවන වත්කම් සඳහා රු.282,743 ක් ක්ෂය ගණනය කර ගිණුම් ගත කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 9 හා 15 ඡේද ප්‍රකාරව ප්‍රමිත නිර්මාණය කරන ආයතනවල වඩාත් මෑත කාලීන ප්‍රකාශ කිරීම් අනුව අනාගත සේවක වැටුප් වැඩිවීම, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයුගණක උපකල්පන පදනම් කරගෙන ප්‍රතිපත්තියක් සකස් කළ යුතු වුවත් එවැනි ප්‍රතිපත්තියක් සකස් කර ගෙන නොතිබුණි. එහෙත් සේවකයින් අවසන්වරට ලබාගත් වැටුප හා සේවා කාලය පදනම් කරගෙන පාරිතෝෂික සඳහා වෙන් කිරීම් සිදු කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට එම විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.1,583,778 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාල උපකරණ හා මෝටර් වාහන රු.3,518,530 කින් පිරිවැය ඉක්මවා ක්ෂය කර තිබුණි.

(ආ) 2014,2015 හා 2016 වර්ෂවලට අදාලව 2017 මැයි 30 දින ගෙවා තිබුණු රු.12,011,000 ක්වූ සේවක ප්‍රසාද දීමනා පෙර වර්ෂවල ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයට සේවක ප්‍රසාද දීමනා සඳහා ඇස්තමේන්තු පිළියෙල කර වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

**2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය | 2017දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කරන ලද නිලධාරින් 10 දෙනෙකුගෙන් එකතුව රු.881,760 ක් වූ ණය ශේෂයන් අයවිය යුතු පැවතුනි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) වගන්තිය | අත්තිකාරම් ලබා ගත් කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවත් මානව සම්පත් විගණනය සඳහා පෞද්ගලික සමාගමකට ලබා දුන් රු.219,000 ක් වූ අත්තිකාරම 2018 ජුනි 30 දින වන විටත් පියවා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1. මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.50,830,861 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.6,660,137 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 44,170,724 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පුනරාවර්තන ප්‍රදාන රු.88,652,320 කින් වැඩිවීම හා පෞද්ගලික පඩිනඩි වෙනත් මෙහෙයුම් වියදම් හා ගොඩනැගිලි කුලී පිළිවෙලින් රු.34,361,943 කින්, 8,764,413 කින් හා රු.6,685,806 කින් වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 හි මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවතියද එය වාර්ෂිකව උච්ඡාවචනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.190,252,253 ක් වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.343,944,401 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 300 ක් ඇතුළුව වැඩසටහන් 600 ක් නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.8,474,299 ක් වැය කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී එම වැඩසටහන් 105 ක් පමණක් පවත්වා තිබුණු අතර දිස්ත්‍රික්ක 03 ක කිසිදු පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා නොතිබුණි.

(ආ) පැසැල් ළමුන් සංඛ්‍යාව පදනම් කරගෙන අදාල දිස්ත්‍රික්කවලට ප්‍රමුඛතාවය ලැබෙන අයුරින් හා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2007 ජුලි 11 දිනැති අංක 1505/11 දරන ගැසට් නිවේදනයේ සඳහන් භාණ්ඩ අලෙවි කරනු ලබන සියලුම ආනයනකරුවන් හා බෙදාහරින්නන් ඒ අනුව කටයුතු කරන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා අධිකාරිය විසින් සමීක්ෂණයක් සිදු කර තිබුණි. එම සමීක්ෂණයේදී, ගැසට් නිවේදනයේ සඳහන් භාණ්ඩවල ආනයනකරුගේ, බෙදාහරින්නන්ගේ විස්තර සඳහන් නොකිරීම, උපරිම සිල්ලර මිල ලකුණුකර නොතිබීම, ඇතැම් භාණ්ඩ වල මිල මත නැවත කඩහිමියන් විසින් මිල සළකුණු කිරීම ආදී කරුණු නිරීක්ෂණය කර තිබුණු බැවින්, ඉහත ගැසට් නිවේදනයේ නියෝගයන් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වන අතර එම නියෝගයන් ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) අධිකාරිය පිහිටුවීමට අදාල පනතේ 13 වන වගන්තියෙන් අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි විසඳීම සම්බන්ධයෙන් විධිවිධාන පනවා තිබුණි. අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි හා ඒවා විසඳීම් පිළිබඳ ක්‍රමවත් ලේඛන හෝ දත්ත පද්ධතියක් පවත්වා නොතිබීම හේතුවෙන් නොවිසඳු පැමිණිලි පිළිබඳව හා විසඳීමේ ප්‍රමාදයන් පිළිබඳව පරීක්ෂා කිරීමට නොහැකි වන අතර මේ හේතුවෙන් පාරිභෝගික සුරාකෑම්වලට එරෙහිව සහනයක් ලබා දීම සහ පාරිභෝගිකයින්ගේ ජිවිත සහ දේපලවලට උපද්‍රවයන් සිදුවන

භාණ්ඩ හා සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම යන අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම බාධාවක් බව නිරීක්ෂණය වේ.

(ඉ) 2008 වර්ෂයේ සිට සහල් නිශ්චිත භාණ්ඩයක් ලෙස නම්කර තිබුණද, පනතේ 20(5) වගන්තිය ප්‍රකාරව සහල් වර්ග 3 ක් සඳහා වරින්වර උපරිම සිල්ලර මිල නියම කර ගැසට් නිවේදන නිකුත් කර තිබුණි. 2017 දෙසැම්බර් 26 දින නිකුත් කළ අංක 2051/8 දරන ගැසට් නිවේදනය මගින් නාඩු සහල් කිලෝග්‍රෑම් 1ක් සඳහා පමණක් උපරිම සිල්ලර මිල නියම කිරීම නිසා අනෙකුත් සහල් වර්ගවල සිල්ලර මිල පාලනයෙන් බැහැර වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් සිදු කළ මුළු වෙළඳසැල් වැටලීම් 25,605 න් සියයට 38 ක් භාණ්ඩ මිල ලකුණු කිරීම, ලේබල් කිරීම සහ ඇසිරීම සම්බන්ධයෙන්ද සියයට 26.98 ක් මිල ලැයිස්තුව ප්‍රදර්ශනය නොකිරීම සම්බන්ධයෙන්ද සිදු කර තිබුණි. එසේ වුවත් ලකුණු කල මිලට වැඩි මිලකට විකිණීම, භාණ්ඩ හා සේවා සැපයීමට අදාල ප්‍රමිති හා පිරිවිතර, නිශ්චිත භාණ්ඩ හා සේවා වල මිල සහ උපරිම මිල නියම කළ භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධයෙන් වැටලීම් සිදු කර තිබුණේ මුළු වැටලීම් වලින් පිළිවෙලින් සියයට 4.08, 0.48,0.06 හා 9.1 ක් වැනි අඩු ප්‍රමාණයක් විය. තවද අධිකාරි පනතේ 29 වන වගන්තිය අනුව වෙළෙන්දා විසින් දැන්වීම් ප්‍රවරුවක් සැපයීම සම්බන්ධයෙන් කිසිදු වැටලීමක් සිදු කර නොතිබුණි.

(උ) 2016 හා 2017 වර්ෂයන් වලදී සිදු කරනු ලැබූ වැටලීම් වලින් පිළිවෙලින් වැටලීම් 201 ක් හා 434 ක් සඳහා නඩු පවරා නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් අනුමැතියකින් තොරව පත් කරන ලද උපදේශකයින් සඳහා වැටුප් හා දීමනා ගෙවීම නීත්‍යානුකූල නොවන බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 අගෝස්තු 11 දිනැති අංක DMS/1736/VOL 1 දරන ලිපිය මගින් දන්වා තිබියදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ 2016 වර්ෂයේදී උපදේශකවරුන් 05 දෙනෙකු පත්කර තිබුණි. 2015 අප්‍රේල් 01 දිනැති අමප/15/0180/613/008 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කර ගනිමින් එම උපදේශකවරුන් බඳවාගත් දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා උපදේශන දීමනා, ඉන්ධන දීමනා හා ප්‍රවාහන දීමනා වශයෙන් රු.5,490,720 ක් ගෙවා තිබුණි.

(ආ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට අයත් වාහනයක් අලුත්වැඩියා කිරීම සඳහා අධිකාරිය විසින් 2016 වර්ෂයේදී රු.2,275,187 ක් වැයකර තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සිග්‍රහයේ 9.3.1(අ) ඡේදය පරිදි අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම වාහනය මාස 08 ක් පමණක් පාවිච්චි කර නැවත එම අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. 2017 ජුනි 15 දිනැති CAA/HRA/VEH/24 අංක දරන ලිපියේ මෙම අලුත්වැඩියා වියදම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට ඉල්ලුම් කර තිබුණද විගණිත දින වන විටත් අමාත්‍යාංශයේ එම වියදම ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

අධිකාරිය විසින් විවිධ හේතූන් මත අයකරන ලද දඩ මුදල් සම්බන්ධයෙන් උසාවි වලින් ලැබෙන ලේඛන හා ආයතනයේ පවත්වාගෙන යන ලේඛන වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී හඳුනානොගත් දඩ මුදල් ශේෂය රු.796,003 සිට රු.10,006,585 දක්වාද ලැබිය යුතු දඩ මුදල් ශේෂය රු.4,229,491 සිට රු.14,635,071 දක්වා වැඩි වී තිබුණි.

## 4.4 කාර්යමණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ද්විතියික පදනම මත හා වැඩ බැලීමේ පදනම මත අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියකු පත්කර තිබුණු අතර 2010 මාර්තු 25 දින සිට ස්ථිර නිලධාරියකු පත් කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික්කවල ඇති වෙළඳසැල් ප්‍රමාණය හා ජනගහනය පදනම් කරගෙන එක් එක් දිස්ත්‍රික්කවල අනුයුක්ත කළ යුතු විමර්ශන නිලධාරින් ප්‍රමාණය තීරණය කර තිබුණද 2018 මාර්තු 28 දින වන විට දිස්ත්‍රික්ක 06 ක නිලධාරින් 87 ක අතිරික්ත ප්‍රමාණයක්ද තවත් දිස්ත්‍රික්ක 06 ක නිලධාරින් 92 ක ඌනතාවයක්ද පැවතුණි.

## 5 තිරසාර සංවර්ධනය

---

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු කරා ලඟාවීම

---

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව අධිකාරිය විසින් අරමුණු හා ඉලක්ක ලෙස පිළිවෙලින් "වගකීමෙන් යුතු පාරිභෝජනය හා නිෂ්පාදනය", "ගුණාත්මක බවින් ඉහළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බෙදාහැරීම" යන අරමුණු හඳුනාගෙන තිබුණු අතර එම අරමුණු හා ඉලක්ක මැනීම සඳහා අධිකාරය විසින් දර්ශක, සංධිස්ථාන හා පාදක දත්ත හඳුනාගෙන නොතිබුණි.

## 6 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---

### 6.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද අධිකාරිය විසින් 2016 වාර්ෂික වාර්තාව විගණිත දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) සේවක ණය අයකර ගැනීම | සේවක ණය අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම, සේවක ණය කාල විශ්ලේෂණයක් පිළියෙල නොකිරීම. |
| (ආ) දඩ මුදල් එකතු කිරීම | දඩ මුදල් එකතු කර ගැනීම යාවත්කාලීන නොවීම |

| | |
|---|---|
| (ඇ) නිලධාරීන් පුහුණු කිරීම | සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොවීම. |
| (ඈ) පැමිණිලි විසඳීම | පැමිණිලි ලිපිගොනු අසම්පූර්ණ හා යාවත්කාලීන නොවීම, පැමිණිලි විසඳීමේ ප්‍රමාදය හා වාර්ෂික ඉලක්කයන් ඇතිකර නොගැනීම. |

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සභාපතිවරයාගේ අදහස් දැක්වීම</u>**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන් 07**

මෙහි සඳහන් ගිණුම්කරණ දෝෂ මේ වන විට නිවැරදි කර ඇති අතර 2018 අවසන් ගිණුම මඟින් ඒය ඉදිරිපත් කෙරේ.

**2.2.2 ගිණුම්කරණ දෝෂ**

සේවක ප්‍රතිලාභ වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ගණනයෙහි පැවති දෝෂය නිවැරදි කළ අතර එය 2018 අවසන් ගිණුම මඟින් ඉදිරිපත් කරනු ලැබේ.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) වාහන ක්ෂයවීම හා සම්බන්ධ දෝෂ නිවැරදි කරන ලද අතර 2018 ගිණුම මඟින් එය ඉදිරිපත් කරනු ලැබේ.

(ආ) මෙබඳු දෝෂ වළක්වා ගැනීමට හැකි උපරිමයෙන් කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබේ.

**2.2.4 නීති සහ නියමයන්, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ සමඟ වන අනුකූලතාව**

(අ) වැඩ තහනම් කළ නිලධාරීන් 10 දෙනාගෙන් 6 දෙනෙකු 2018/06/07 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙහි පිහිටුවන ලද අතර ඔවුන්ගෙන් අදාළ මුදල් අය කරගනිමින් පවතියි. අනෙක් නිලධාරීන් සිව් දෙනාගෙන් හිඟ මුදල් අයකරගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව විගණනය සඳහා මූලික ක්‍රියාමාර්ග ගෙන තිබේ.

(ආ) නොපියවන ලද අත්තිකාරම්

මේ වන විට සියලුම අත්තිකාරම් පියවා ඇති අතර මානව සම්පත් විගණන කටයුතු අවසන් වී නොමැති හෙයින් ඒ සඳහා ලබාගත් අත්තිකාරම පමණක් පියවා නොමැත.

**4 <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම්**

(අ) 2017 වර්යේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව දැනුවත්කිරීමේ වැඩසටහන් ප්‍රමාණය පහළ අගයක් ගත්තද, වර්ෂය තුළ දී ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රධාන ඉලක්කය වූයේ පාරිභෝගික ප්‍රජාව බව සඳහන් කරනු කැමැත්තෙමි. ජාත්‍යන්තර පාරිභෝගික අයිතිවාසිකම් සැමරුම 2017 මාර්තු මස 15 වන දින ගරු. ජනාධිපති, ගරු කර්මාන්ත හා වාණිජ අමාත්‍ය සහ පළාත් ආණ්ඩුකාරවරුන් ඇතුළත්ව වෙනත් අමාත්‍යවරුන්, විදේශ තානාපතිවරුන්, ආරක්ෂක ප්‍රධානීන් රාජ්‍ය සහ පෞද්ගලික අංශ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්, පාසල් සිසුන් සහ පාරිභෝගික ජනතාවගේ සහභාගීත්වයෙන් නෙළුම් පොකුණ රඟහලේ දී පැවැත්විණි. එහිදී පාරිභෝගික කටයුතු පිළිබඳ ජාත්‍යන්තර ආයතනයේ ආසියානු කලාපයේ නිත්‍ය නියෝජිතවරයා ආරාධිත දේශකයා වශයෙන් සහභාගී විය. මෙම වැඩසටහනට සමගාමීව වීඩියෝ, නිර්මාණාත්මක රචනය සහ ට්විටර් පිළිබඳ විවෘත තරඟ පැවැත්වුණු අතර වටිනා ත්‍යාග ලබාදෙන ලදී. තවද, මෙම වැඩසටහන සඳහා රාජ්‍ය සහ පෞද්ගලික විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය, සමාජ වෙබ් අඩවි සහ වෙනත් සමාජ ජාල මඟින් දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් විශාල ප්‍රචාරයක් හිමිවිය.

දිස්ත්‍රික්ක මට්ටමෙන් දැනුවත්කිරීමේ කාර්යය සඳහා නියුක්ත කර තිබූ නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණයත් නොවීම හේතුවෙන් දිස්ත්‍රික්ක කිහිපයක දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම දුෂ්කර විය. මේවන විට අලුතෙන් පත්වීම් ලද විමර්ශන නිලධාරීන් දිස්ත්‍රික් කාර්යාල වෙත අනුයුක්ත කර තිබේ. මේ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු වල නිරත වූ අතර අධිකාරියේ විගණන කමිටු වලදී ද සාකච්ඡාවට බඳුන් විය.

(ආ) දැනුවත්කිරීමේ වැඩසටහන් 2017 වර්ෂයේ දී නව මුහුණුවරකින් ක්‍රියාත්මක වූ අතර පුද්ගලයින් රැසකගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් කිහිපයක පැවැත්විණි. විශේෂයෙන් ම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පත්වීම් ලද උපදේශක නිලධාරීන්ගේ අනුදැනුම යටතේ ගම්පහ වැනි දිස්ත්‍රික්ක වල දැනුවත් කරීමේ වැඩසටහන් රැසක් පැවැත්විණි.

තවද සමස්ත දිවයින පුරා විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය භාවිතයෙන් පාරිභෝගික අධිකාරිය මඟින් අවම පිරිවැය භාවිතයෙන් කර්යයන් ඉටු කරන ආකාරය පිළිබඳව විශාල ජනතාවක් දැනුවත් කරන ලදී.

(ඇ) උපරිම සිල්ලර මිල සහතිකකරගැනීම සඳහා 2017 වර්ෂය තුළදී ආනයනකරුවන් සහ බෙදාහරින්නන් වෙතින් අයදුම්පත්‍ර 326 ක් පමණ ලැබිණි. අයදුම්පත් වල සඳහන් මිල ගණන් සත්‍ය වශයෙන්ම වෙළඳපොළ තුළ ක්‍රියාත්මක වන්නේ ද යන්න පරීක්ෂා කිරීමේ කාර්යය විමර්ශන නිලධාරීන් කණ්ඩායමකට පැවරිණි.

(ඈ) අධිකාරියට යොමු වන පැමිණිලි පිළිබඳ තොරතුරු ඇතුළත්කිරීම සඳහා ලේඛන පවත්වාගෙන යනු ලබන අතර ඒමඟින් පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම ප්‍රමාද වීම සඳහා කරුණු සපයයි. ඒ අනුව පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම පරීක්ෂා කිරීමට අදාළ තොරතුරු ලබාගතහැකිය. නමුත්, මෙම කාර්යය වේගවත්කිරීම සඳහා නීති අංශය සතුව නිසියාකාරයෙන් පරිගණකගත කරන ලද දත්ත සංචිතයක් නොමැත.

(ඉ) 2008 වර්ෂයේ සිට සහල් විශේෂිත පාරිභෝගික ද්‍රව්‍යයක් වශයෙන් සැලකුව ද , උපරිම සිල්ලර මිල සලකා බැලීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියෙන් විමසිය යුතු අතර පනතෙහි 19 වන වගන්තියෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවෙන් වාර්තා කැඳවිය යුතුය. ඒ අනුව, පාරිභෝගික කටයුතු පිලිබඳ සභාවේ නිර්දේශය සහ අධිකාරියේ අනුමැතිය මත නීති අංශය විසින් අදාළ ගැසට් පත්‍ර පමණක් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

(ඊ) පවත්නා කාලයට අදාළ හඳුනාගත් සමාජ ආර්ථික ගැටළු අනුව වැටලීම් සිදු කරනු ලබන අතර පනතෙහි වගන්තිවල සඳහන් ආකාරයට වැටලීම් සිදුකිරීම, ප්‍රතිශතයන ගණනය කිරීම සහ සහ සංසන්දනයකිරීම සුදුසු නොවේ.

(උ) පාරිභෝගික ද්‍රව්‍යයන්හි සාම්පල ලබාගැනීම වැටලීම් ලෙසට සඳහන් කර පැවතිය ද 2017 වර්ෂයේ දී එබඳු සිද්ධීන් ගොනු කර නොමැති අතර ඉදිරියේ දී සාම්පල ලබාගැනීම් සටහන් කිරීමට වෙනම ලේඛනයක් ලබා දී තිබේ. මේ ආකාරයට අනාගතයේ දී මෙම ගැටළුව විසඳෙනු ඇත.

ගොනු කරන ලද නඩු හැරුණු කොට 2017 වර්ෂයේ දී සිදුකරන ලද සෙසු වැටලීම් ගොනු කිරිම වේගවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

(අ) ගරු විෂයභාර ඇමතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනතෙහි 53 වන වගන්තිය ප්‍රකාරව උපදේශකවරුන් පත්කිරීමට කටයුතු කරන ලදී. නමුත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ විස්තර විභාගය මත සියලුම පත්කිරීම් අත්හිටුවන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය නිරීක්ෂණය පිණිස පැහැදිලි අර්ථ දැක්වීමක් ලබාගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර මේ වන විට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටියි.

(ආ) අළුත්වැඩියාකිරීම් සඳහා ගෙවීම් කිරීමට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන තිබේ.

අළුත්වැඩියා සඳහා වන ගෙවීම් අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**4.4 කාර්ය මණ්ඩල කළමනාකරණය**

(a) මෙම දෝෂය නිවැරදි කරගැනීම සඳහා කඩිනම් පියවර ගනු ලැබේ.
(b) දිස්ත්‍රික්කවල පවතින නිලධාරී හිඟය සහ අතිරික්තය සම්බන්ධ ගැටළු මඟහැරීම සඳහා නිලධාරීන් නිසියාකරයෙන් රාජකාරියෙහි යෙදවීමට පියවර ගෙන තිබේ. මෙමඟින් ඉහත ගැටළුව විසඳෙනු ඇත.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන ඉලක්ක කරා යොමුවීම**

අධිකාරියෙහි ඒකාබද්ධ සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමේ දී සහ අධිකාරී පනත ප්‍රකාරව නියමයන් නිකුත් කිරීමේ දී මෙම කරුණ සැලකිල්ලට ගෙන තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට පියවර ගෙන තිබේ.

**6. වගවීම සහ යහපාලනය**

**6.1 වාර්ෂික වාර්තා සභාගතකිරීම**

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයෙහි 6.5.3 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂයේ දින 150 ක් සම්පූර්ණ වන අවස්ථාවේදී වාර්ෂික වාර්තාව සභාගත කළයුතු වුවද විගණනය කරනු ලබන දිනය වන විට ද අධිකාරිය විසින් 2016 වාර්ෂික වාර්තාව සභාගතකර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනය සම්බන්ධ දෝෂ අධිකාරියේ සභාපතිවරයා වෙත සලකාබැලීම සඳහා යොමු කරන ලදී. පහත දැක්වෙන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| <u>පද්ධති හා පාලන ක්ෂේත්‍රය</u> | <u>නිරීක්ෂණය</u> |
| --- | --- |
| (අ) සේවක ණය අයකරගැනීම | නිවැරදිව ගිණුම්ගත කරන ලදී. |
| (ආ) දඩමුදල් එකතු කිරීම | ආයතන සංග්‍රහයේ අදාළ වගන්ති ප්‍රකාරව වැඩ තහනම් කරන ලද නිලධාරීන් සම්බන්ධ නෛතික විමර්ශන මේ වන විට පැවැත්වේ. |

ආචාර්ය ලලිත් එන් සෙනවීර

සභාපති